# කෘෂිකාර්මික සංවර්ධනයට රුකුල් දෙන ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය

අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශයේ ප්‍රධාන

**අතුල චන්ද්‍රසිරි**

**විසිනි**

අප රටේ ආර්ථිකය මෙන්ම ජන ජීවිතය හා සංස්කෘතියද ගොඩ නැගී ඇත්තේ ගොවිතැන ආශ්‍රයෙනි. ශත වර්ෂ 25 ට අධික කාලයක ප්‍රෞඪ ඉතිහාසයක් ඇති ජනතාවගේ ප්‍රථම මෙන්ම බහුතරයේ දැනුදු ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මයයි. එමනිසා කෘෂිකර්මය අනාදිමත් කාලයක සිට අද දක්වාම ලංකාවේ ආර්ථික ක්‍රමයේ කොඳු නාරටියයි. වර්තමානයේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 25% කට පමණ කෘෂිකර්මය වග කියන අතර එය මුළු විදේශ විනිමය ඉපයීම් වලින් 60% ක් පමණ ලබා දෙයි. රටේ ලේඛණගත ශ්‍රම හමුදාවෙන් 50% ට වැඩි ප්‍රමාණයක් කෘෂිකර්මය ආශ්‍රිත රැකියාවල නියැලී සිටිති. සම්ප්‍රදායානුකූල ගැමි කෘෂිකර්මය හෙක්ටයාර් මිලියන 1.58 නැත්නම් 78%ක වගා කරන ලද භූමි ප්‍රමාණය වසාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනය වන ලක්ෂ 160 න් ගොවි පවුල් දහඅට ලක්ෂයකට වැඩිවන ගොවි ජනතාව මුළු ජනගහනයෙන් සියයට 50 ට වැඩි ප්‍රමාණයකි. 70% ක් පමණ ගොවීන්ට අයත් වන්නේ හෙක්ටයාර් 1 ට අඩු ඉඩම් ප්‍රමාණයකි. මෙසින් වී ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය කරගත් ගොවි පවුල් සංඛ්‍යාව ලක්ෂ 6ක් පමණ වෙයි.

මේසා වැදගත්කමක් දරන රටේ අස්සක් මුල්ලක් නෑර පැතිර පවත්නා රටේ විශාලම වැඩකරන ජන කොට්ඨාශය සිටින කෘෂිකර්ම ක්ෂේත්‍රය ක්‍රියාත්මක කරන ගොවි ජනතාවගේ ආර්ථික හා සමාජ සුරක්ෂිත භාවය සඳහා ස්ථිර වැඩ පිළිවෙලක් මෙතරම් දීර්ඝ කාලයකට සකස් නොකිරීම පිළිබඳව අප රටේ ගොවි ජනතාව වෙනුවෙන් නිරන්තරයෙන් කථා කරන එමෙන්ම තම තමන්ගේ බල කඳවුරු ශක්තිමත් කර ගැනීමට ඔවුන් පාවිච්චි කරන කවුරුන් විසිනුත් තම තමන්ගෙන්ම ප්‍රශ්න කළ යුතුවෙයි. "මඩ සෝදාගත් කල ගොවියා රජකමටත් සුදුසුය", "ජනතාවට බත් සපයන ගොවියා", "නාගරික ජනතාව ජීවත් වන්නේ ගැමි ජනතාව නිසාය" ආදී වදන් අප කොතෙකුත් අසා ඇතත් ඒවා නීරස, ප්‍රලාප බව ජනතාව ප්‍රත්‍යක්ෂ කොටගෙන ඇත. කැබුරු පනත ගොවි ජනතාවගේ ආර්ථික හා සමාජ තත්ත්වය සුරැකිම සඳහා ගත් එක් වැදගත් පියවරකි. එහෙත් එහි නිර්මාතෘවරයා අපේක්ෂිත අන්දමින් ඒ පනතේ සඳහන් කොන්දේසි කොයිතරම් දුරට අද ක්‍රියාත්මක වේද? ඇත්තෙන්ම එය නිසි අන්දමින් ගොවියාට සැබෑ යහපතක් සැලසෙන පරිදි ක්‍රියාත්මක කිරීමට පසුගිය දශක තුන තුළ (1957-87) කාලයේ සැබෑ උත්සාහයක් ගත්තේද? මේ පිළිබඳව ඇගැයීමක් කිරීම ඉතාම කාලෝචිත යැයි හැඟේ. අප අත්දැකීමෙන් දන්නා පරිදි නීති ක්‍රියාත්මක කිරීමේදී දක්වන ආකල්පය උඩ එය රටට පොදු වශයෙන් බලපාන නීතියක්ද නැත්නම් නීති පොතට පමණක් සීමාවන එකක්ද යන්න තීරණය වේ.

කම්කරු හා සේවා අංශ මෙන්ම වැවිලි අංශයද වයසින් සම්ප්‍රදායානුකූල කෘෂිකර්ම අංශයට වඩා බොහෝ සෙයින් ලාබාලය. එහෙත් එම අංශවල ශුභසිද්ධියට මෙන්ම සුරක්ෂිතභාවයට විශ්‍රාම වැටුප්, සේවක

අර්ථසාධක අරමුදල් ක්‍රමය හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් ක්‍රමය තිබේ. කෘෂිකර්ම අංශයට එවැනි ආරක්ෂාවක් සලසා නොතිබීම බලවත් අඩුපාඩුවක් මෙන්ම ඓතිහාසික අසාධාරණයක් ලෙස සැලකිය හැක. මෙම නව ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් එම ඓතිහාසික අසාධාරණය මගහැරීමට කටයුතු කරනු ඇත. කෘෂිකර්මය අනෙක් අංශ මෙන් නොව නිතැතින්ම හා ස්වභාවයෙන්ම, ස්වභාවික ව්‍යසනයන්ට ගොදුරු වන්නේය. ගොවියා බොහෝ දුරට නොවැළැක්විය හැකි ගංවතුර, නියඟ, කෘමි උවදුරු හා ලෙඩරෝග වැනි ස්වභාවික, හේතූවලට පමණක් නොව හෝග සොරකම්, ආත්මාර්ථකාමී ආකල්ප හා මහජන කැළඹිලි වැනි වැළැක්විය හැකි, මිනිසා විසින්ම ඇතිකරන හේතූන්ටද මුහුණ පායි. කෘෂිකාර්මික නිෂ්පාදන බොහෝ සෙයින් මූලික භාණ්ඩ ගණයට අයත් වන නිසා ඒවා ජාත්‍යන්තර මිල උච්චාවචනයන්ටද කෙළින්ම හසුවේ.

කාර්මික භාණ්ඩ සමඟ සසඳා බලන කල කෘෂිකාර්මික භාණ්ඩ මිලෙහි වැඩි අස්ථාවරත්වයක් ඇතිවා පමණක් නොව ඒ නිසාම නිෂ්පාදකයාගේ ආදායමද විශාල වෙනස්වීම් වලට භාජනය වේ. මෙවැනි අනියතතාවන්ගෙන් ගහණ තත්ත්වයකට නිරන්තරයෙන්ම මුහුණපා ක්‍රියා කරන ගොවි ජනතාවගේ පැවැත්ම ස්ථාවර කිරීමට විශ්‍රාම වැටුප් පනතින් කරන උත්සාහයේ සාධාරනත්වය මෙම කරුණු මගින් සනාථ කරයි.

කුඹුරු පනතින් උත්සාහ කලේ ගොවියාට තමන් වැඩකරන කුඹුර දිගටම වැඩ කිරීමේ අයිතිය එනම් තවත් අතකින් කිව හොත් තම රැකියාව ස්ථිර කිරීමත්, රැකියාවට ලැබෙන වැටුප නැත්නම් කුඹුරෙන් ලැබෙන අස්වැන්න ප්‍රමාණවත් හා සුරක්ෂිත තත්ත්වයකට පත් කිරීමත්ය.

කුඹුරු පනතේ සිට ගොවි විශ්‍රාම වැටුප් පනත දක්වා අවුරුදු 30 තරම් දීර්ඝ



කාල පරතරයක් දක්නට ඇත. නව ගොවි විශ්‍රාම වැටුප් පනතින්, කැඹුරු පනතින් තැබූ පියවර තවත් ඉදිරියට ගෙන යමින් ගොවියාගේ අනාගතය වඩාත් ආරක්ෂාකාරී සුරක්ෂිත තත්ත්වයකට පත් කිරීමට මග සලසයි. රටට ඉතා වැදගත් සේවයක් කොට මිය යනතුරු අනුන්ට අත නොපා ජීවත්වීමේ හැකියාවක් ඇති, ආත්ම ශක්තියකින් හා ආත්ම ගරුත්වයකින් හෙබි ජන කොටසක් බවට ගොවි ජනතාව පත් කිරීමේ උදාර මෙහෙය මෙම පනතින් අරමුණු කරයි. අද ඇත්තෙන්ම වැඩ කිරීමට නොහැකි ගොවි ජනතාව තම දෙපයින් නැගී සිටීමට නොහැකි තම දරුවන්ගේ නෑදෑයින්ගේ හෝ අසල් වැසියන්ගේ හොඳහිත හා උපකාරය මත ජීවත්වන අසරණ පරපුටුවන් පිරිසකි. අවුරුදු සිය ගණනකට පෙර කල යුතුව තිබූ ඓතිහාසික මෙහෙයක් වන එම දීන තත්තවයෙන් ගොවියා මුදා ගැනීම නව පනතින් ඉටු කරනු ලබයි.

නිත්‍යානුකූලව විශ්‍රාම වැටුපකට හිමිකම් කියන ගොවි ජනතාවක් සිටින ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව විය හැකිය. එවැන්නකින් ගොඩනැගෙන ආත්ම ශක්තිය, උදාර හැඟීම් හා චිත්ත ධෛර්යය, ශක්තිමත් ගොවි ජනතාවක් ඇතිවීමටත් එයින් කෘෂිකර්ම සංවර්ධනය නව යුගයකට පිවිසීමටත් හේතු වනු ඇත. සමාජයීය රැකවරණය, ආත්ම විශ්වාසය හා ස්වශක්තිය වැනි දෑ ගොඩ නැගෙන්නේ ආර්ථික හේතු පදනම් කර ගෙනය. ශක්තිමත් ආර්ථික පදනමකින් තොරව එවැනි සංකල්ප හුවා දැක්වීම අර්ථ ශූන්‍ය වෙයි. මෙම පනතින් ගොවි ජනතාවගේ අනාගතයට සුරක්ෂිත මෙන්ම බලාපොරොත්තු ඇතිකර ගතහැකි ශක්තිමත් ආර්ථික අඩිතාලමක් දැමීමට මග පෑදෙනු ඇත. ගොවි ජනතාව විසිරී ඇති සංවිධානය නොවූ පිරිසකි. ගොවි ජනතාවට තම ඉල්ලීම් ලබා ගැනීමට හෝ ඒ සඳහා සටන් කිරීමට හෝ සංවිධානාත්මක වූ සමිති සමාගම් හෝ වෘත්තීය සමිති නොමැත. එබැවින් මෙවැනි පනතක අවශ්‍යතාවය හා සාධාරණකම වඩාත් ඉස්මතුවී පෙනෙන අතර එය දූරදර්ශී හා සමාජ ශුභවාදී ආකල්පයක ප්‍රතිඵලයක් ලෙස හඳුන්වා දීමට පුළුවන.

ජපානයේ ගොවි ජනතාව සමාජයේ අනෙක් කොටස් සමග සම තත්ත්වයෙන් කටයුතු කරන කොටසක් බවට පත්කර ඇත්තේ මිල ක්‍රමය හා අලෙවිය රජය මගින් හැසිරවීමෙනි. මිල ආධාරක ප්‍රතිපත්තියක් මගින් ස්ථිර ඉහළ මිලක් ගොවියාට ලබා දී ඇති අතර, අලෙවියට සම්බන්ධ වියදම් රජය මගින් දරා පාරිභෝගිකයාටද ස්ථිර මිලකට සහල් ලබා දෙයි. මේ ප්‍රතිපත්තියෙන් බලාපොරොත්තු වන්නේ ගොවි ජනතාවගේ ආර්ථික තත්ත්වය වඩාත් යහපත් කර්මාන්ත අංශය සමග හැකිතරම් කිට්ටුවෙන් තබාගෙන එමගින් නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය අනුබලය හා උනන්දුව ගොවිජනයා තුළින්ම ලබා ගැනීමය.

ගොවි විශ්‍රාම වැටුප් පනතෙන්ද ගොවි ජනතාවට පෙර කිසිදාක නොතිබූ සමාජමය ආරක්ෂණයක් හා ආර්ථික ස්ථිරත්වයක් ලබා දෙන අතර නිෂ්පාදනය වැඩිකරලීමට උනන්දුවක් ජනිත කරවයි. ඔහුගේ මහඟු සේවයට සමාජය විසින් කෘතගුණ සැලකීමේ උතුම් ගුණාංගය මෙහි ගැබ්වී ඇත. අනෙක් කොටස් (රජයේ සේවය, පෞද්ගලික අංශයේ සේවය හා වතු අංශයේ සේවය) මෙන්ම තමන්ද සමාන අයිතිවාසිකම් භුක්ති විඳින කොටසක්ය යන හැඟීම හා එමගින් අනාගත සුරක්ෂිත භාවය මෙන්ම ස්වශක්තිය ගොඩ නංවාලීම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විශාල පෙරළියක් ඇති කරලීමට තුඩු දෙනු ඇත.

පනත සම්මත වී නීතිගත වූවායින් පසුව වඩාත්ම වැදගත් කාර්යය වන්නේ එය ක්‍රියාත්මක කිරීමය. එහි සම්පූර්ණ සාර්ථකත්වය රඳා පවතින්නේ ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය හා නිවැරදි භාවය උඩය. එබැවින් මෙම ඵලදායී පනත අපේක්ෂිත අරමුණු ඉටුවන සේ ක්‍රියාත්මක කිරීමේ හරදූර වගකීම නිවැරදිව අවබෝධ කර ගැනීම හා ඒ අනුව ක්‍රියා කිරීම නියමිත අධිකාරීන්ගේ පරම යුතුකම වන්නේය.

රජයේ හා සංස්ථා සේවයේ නියැලියන්ට අවුරුදු 55 දී විශ්‍රාම යැමේ හා විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල් ආපසු ලබා ගැනීම ආදී පහසුකම් ලබාදී තිබියදී ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය පමණක් අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීම වෙනුවට එය ද අවුරුදු 55 දක්වා අඩුකොට අනෙකුත් සේවා සමග සමාන කිරීම සලකා බැලිය යුත්තකි. අර්ථසාධක අරමුදල් ක්‍රමය අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වන ක්‍රමයක් වන අතර, එයට නීතිය තදින්ම ආරෝපනය කිරීමට කම්කරු දෙපාර්තමේන්තුවත්, ශ්‍රී ලංකා මහ බැංකුවත් කටයුතු කරති. අනෙක් අතට ගොවි විශ්‍රාම වැපුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සිදුවන්නේ ඊට ඉඳුරාම වෙනස්, ගොවියා සිය කැමැත්තෙන්ම දායක මුදල් ගෙවීමේ පදනම උඩය. එබැවින් ගොවියාට මෙයින් ලැබෙන වාසි පැහැදිලි කිරීම හා ඔවුන් තුළ ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇතිකිරිම උඩ මෙහි සාර්ථකත්වය සම්පූර්ණයෙන්ම රඳා පවතී. ගොවියා අතරට පනත ගෙනයාම ඉතාම සූක්ෂම හා දක්ෂ අන්දමින් කළ යුතුව ඇති අතර, නීතිමය පදනම යම් ස්වරූපයකින් එම ක්‍රියාදාමයට ඇතුළත් කොට, එය කෙරෙහි ගොවි ජනතාවගේ සිත් සතන් තුළ ස්ථිර හා විශ්වාසනීය භාවයක් ඇතිකිරීම මෙහිලා ඉතා වැදගත් වන්නේය.

අද අවුරුදු 18 දී මෙම විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායක වන පුද්ගලයෙකු තව අවුරුදු 42 කට පසුව එහි සම්පූර්ණ ප්‍රතිලාභ නෙලා ගැනීමට සුදුසස්කු වනු ඇත. එහිදී නගන ප්‍රධාන චෝදනාව වන්නේ මෙතරම් කල කට පසුව මුදලේ වටිනාකම කෙබඳු වේද ? එවකට ලැබෙන රුපියල් හාරදාහකට වැඩි මාසික විශ්‍රාම වැටුපේ මූර්ත වටිනාකම කොපමණද? යන්නයි. එහෙත් අර්ථසාධක අරමුදල් ක්‍රමයට හෝ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායක වන හා විශ්‍රාම වැටුප් හිමිකම් ඇති ලක්ෂ සංඛ්‍යාත ජනතාවට වුවද එම ප්‍රශ්නයට මුහුණපාන්නට සිදුවේ. එපමණක් නොව මුදලේ අගය අඩුවීම වැටුප් ලබන හෝ වෙනත් මාර්ගවලින් ආදායම් ලබන සෑම පුද්ගලයෙකුටම මුහුණ පාන්නට සිදුවන පොදු ප්‍රශ්නයකි. එය වැළැක්විය නොහැකක් වන අතර, එවැනි කරුණුවලින් මෙම පනතින් ලබා දෙන සමාජ සුරක්ෂිතතාව හා චෛතසික විශ්වාසය අවප්‍රමාණ කිරීමට පුළුවන්කමක් නැත.

අර්ථසාධක අරමුදලේ දායකත්වය දරණ අයගේ (රුපියල් දහසක් පමණ වැටුපක් ලබන) වැටුපෙන් අඩු වශයෙන් රු. 100 ට කිට්ටු මුදලක්වත් මාසිකව අඩු කෙරේ. එහෙත් ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය ලබන්නකු (අවු: 18 දී) මාසිකව ගෙවිය යුත්තේ රු. 21.66 කි. එබැවින් වාරිකය අනුව බලන විට අර්ථසාධක අරමුදල් ක්‍රමය හා සසඳා බැලීමේදී ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා ගෙවිය යුතු වන්නේ අඩු මුදලකි. මෙහිදී එකම ප්‍රශ්නය වන්නේ අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ අනිවාර්යයෙන්ම සේවකයා නොදැනුවත්වම තම වැටුපෙන් අඩු කර ගන්නා අතර, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ පුද්ගලයාට වඩාත් දැනෙන පරිදි තමන් විසින්ම ගෙවිය යුතු වීමයි.

ගොවි ජනතාව ආත්ම විශ්වාසයකින් යුතු බලපෑම් ඇති කළ හැකි කොටසක් ලෙස සංවිධානය විය යුතුය. සමස්ත ආර්ථික ක්‍රමයේ ඉතාම වැදගත් කොටසක් ඉටු කරන ගොවියාට සමාජයේ යම් යම් ලැබිය යුතු අයිතිවාසිකම් සඳහා හිමිකමක් ඇත. "ශ්‍රී ලංකාව සහල් අතින් ස්වයංපෝෂිතත්වය ලබා ඇත," නැතත්නම් "ස්වයංපෝෂිතත්වය කරා ළඟා වෙමින් සිටී," ජාත්‍යන්තර වශයෙන බලපාන පරිදී මෙවැනි ප්‍රකාශයන් කිරීමේදී එහි ගෞරවය හෝ දායකත්වය වැඩි වශයෙන්ම ලැබිය යුත්තේ කා හටද ? ගොවි ජනතාවට නොවේද? එහෙත් ගොවි ජනතාවගේ සැබෑ තත්ත්වය ඊට ඉඳුරාම වෙනස් ය. ඔවුන්ට ලැබිය යුතු සමාජ හා ආර්ථික ස්ථාවරත්වය ලැබී නැත.

එම නිසා ගොවි ජනතාව ස්වාධීන තීරණ ගැනීමේ හා ආත්ම විශ්වාසයක් ඇති ජන කොට්ඨාශයක් ලෙස ඒකරාශී කිරීම කෘෂිකර්ම සංවර්ධනයට ඉතා වැදගත් වේ. එම අවශ්‍යතාවය නව ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයෙන් බොහෝ දුරට ඉටුවනු ඇතැයි බලාපොරොත්තු තැබිය හැක.